පොදු චක්‍රලේඛ 02/2025

මගේ අංකය - DCDSP/02/22/04
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (ද.ප),
පෙට්ටිගලවත්ත, ගාල්ල
2025.12. 05

දකුණු පළාතේ සියළුම සමුපකාර සමිතිවල ගරු සභාපතිවරුන් වෙත,

**<u>දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවා ගැනීම, දායකත්වය ලබා දීම</u>**

2019 අංක 02 දරන දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 09 වන වගන්තිය ප්‍රකාරව, උක්ත ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන 2019 අප්‍රේල් මස 01 දින සිට ස්ථිර සේවයට බැඳෙන සමුපකාර සමිති සේවකයන් දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක විය යුතු බව දක්වා ඇත. එහෙත් බොහෝ සමුපකාර සමිතිවල සේවකයන් ස්ථිර පත්වීම් ලැබුවද මෙම සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීම සඳහා ඉල්ලුම් කර නොමැති බව නිරීක්ෂණය වී ඇත. ඒ පිළිබඳ විමර්ශනයේදී මෙම සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිළිබඳ නොදැනුවත් බව, එහි ඇති සාධනීය තත්වයන් පිළිබඳ අනවබෝධය මෙන්ම නියෝග මාලාවේ (අ) උපලේඛණයේ වගු අංක 2 සඳහන් සඳහන් ප්‍රතිලාභ හිමිකම සඳහා විශ්‍රාම යාමට ආසන්නයේ මෙම සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීම සුදුසු බවට වන මතය ද ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. එහෙත් දකුණු පළාතේ සමුපකාර සමිතිවල ස්ථිර සේවකයෝ මෙම සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට නීතියෙන් බැඳී සිටී.

02. එබැවින් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බඳවා ගැනීමේ, දායකත්වය ලබා දීමේ හා විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය තව දුරටත් විධිමත් කරමින් දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ නෛතික අවශ්‍යතා සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

**03. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බඳවා ගැනීම**

සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ක්‍රමයට බඳවා ගැනීම සඳහා හිමිකම් ලබන්නේ ස්ථිර පත්වීමක් ලද සේවකයන් වන අතර සමුපකාර කොමිෂන් සභා ලේකම්ගේ 2022.04.27 දිනැති 02/2022 චක්‍රලේඛය අනුව මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයන් පමණක් බඳවා ගත යුතු බවත්, සමුපකාර සේවක කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසු පමණක් පත්වීම් ලබා දිය යුතු බවත් දක්වා ඇත.

03.1 මවිසින් අනුමත කරන පිරිස් බල තක්සේරුව ඉක්මවා නොයන පරිදි සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් පත්වීම් අනුමත කරන අතර ඒ සඳහා වන සම්මුඛ පරීක්ෂණය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නියෝජනයක් සහිතව සිදු කල යුතු බවට අනිවාර්ය කර ඇත. එබැවින් සමුපකාර සමිතියක යම් තනතුරකට බඳවාගන්නා සේවකයකුගේ පත්වීම අනුමැතිය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත යොමු කිරීමට පෙර සමිතිය භාර සමුපකාර සංවර්ධන නිලධාරියාගේ ද සමීප අධීක්ෂණයට ලක් වේ.

03.2 ඒ අනුව විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණය මඟින් බඳවාගන්නා සේවකයාගේ පත්වීම ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධව සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව විසින් නිසි පරිදි තීරණයක් ගත යුතු අතර එම පත්වීම ක්‍රියාත්මක විය යුතු දිනය සම්මුඛ පරීක්ෂණ දිනයට පෙර දිනයක් නොවිය යුතුය. එම දිනය සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන දිනට පසුව එළඹෙන දිනයක් හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සේවකයාගේ පත්වීම

අනුමත කරන දිනය හෝ විය යුතු ය. එම දිනය අදාල සේවකයා සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බඳවා ගන්නා දිනය ලෙස සලකනු ලබන බවට අදාල සේවකයා දැනුවත් කල යුතුය.

03.3 යම් තනතුරකට අදාලව බඳවාගනු ලබන සේවකයා සම්බන්ධයෙන් සමුපකාර සමිතිය වෙත සමුපකාර සේවක කොමිෂන් සභාව නිකුත් කරන පත්වීම අනුමත කරන ලිපියට ඇතුළත් කල යුතු බැවින්

- 03.3.1 පත්වීම ක්‍රියාත්මක විය යුතු දිනය ,
- 03.3.2 අදාල වැටුප් පරිමාණය හා වැටප් පියවර,
- 03.3.3 වැටුප් වර්ධක දිනය,
- 03.3.4 සමිති වැටුප් ශ්‍රේණිය,
- 03.3.5 උසස් වීමක් නම් පෙර විශ්‍රාම දායක අංකය

යන කරුණු ඇතුළත් වන පරිදි වාර්තාකරණය නිසි පරිදි සිදුකර අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු සෙසු ලේඛණ සමඟ සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය.

03.4 එකී සමුපකාර සේවක කොමිෂන් සභා අනුමැතිය ලබා දීමේ ලිපිය ලද පසු ඉහත 03.3 වගන්තියේ සඳහන් කරුණුද ඇතුළත් කර විධිමත් පත්වීම් ලිපියක් ඔබ විසින් අනුමත සේවකයාට නිකුත් කල යුතුය.

**04. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ගැනීම හා දායක මුදල් ගෙවීම**

සමුපකාර සමිතියක ස්ථිර සේවය සඳහා බැඳෙන සේවකයන් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීම අනිවාර්ය නෛතික අවශ්‍යතාවයකි. ඒ සඳහා එකී සමුපකාර සේවකයා මෙන්ම සමුපකාර සමිතියද බැඳී සිටී. එබැවින් සමුපකාර සේවක කොමිෂන් සභා අනුමැතිය ලද සේවකයකු සම්බන්ධයෙන් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ගැනීමට අදාලව සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ දක්වා ඇති කරුණු කෙරෙහි ද අවධානය යොමු කල යුතුය.

04.1 සමුපකාර සේවක කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලද ලිපිය පදනම් කර අදාල සේවකයා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දායක අංකය, විශ්‍රාම වැටුප් දායකයකු ලෙස සැලකීමට අනුමැතිය ලද සේවකයා හා සමුපකාර සමිතිය විසින් ඉදිරිපත් කල යුතු ලේඛණ හා ආකෘති පිළිබඳ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ විසින් ද ලිඛිතව ඔබ දැනුවත් කරනු ලැබේ.

04.2 දකුණු පළාතේ පළාත් සභාවේ 2019 සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම නියෝග අනුව යෝජනා ක්‍රමයේ දායකයකු ලෙස සැලකීමට අදාල සේවකයාගේ ඉල්ලුම් පත්‍රය අනුමත කල යුතුය. එබැවින් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය ලබා දීමට ඉදිරිපත් කල යුතු බවට සඳහන් ලිපි ලේඛණ කඩිනමින් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ වෙත යොමු කිරීම අදාල සමුපකාර සමිතියේ වගකීමක් වන අතර මෙහි ප්‍රතිලාභය සමුපකාර සේවකයාට වන බැවින් ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛණ සමිතිය වෙත භාර දී සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ගැනීම සඳහා අවධානය යොමු කිරීම සේවකයාගේ ද වගකීමක් බවට අදාල සේවකයා දැනුවත් කිරීම ඔබ විසින් කල යුතු වේ.

04.3 දකුණු පළාතේ පළාත් සභාවේ 2019 සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට අපේක්ෂිත යම් සමුපකාර සේවකයකුගේ ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප වීමට ඇත්තේ ඉතා සීමිත අවස්ථාවක් පමණි. එබැවින් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සඳහන් කරන පත්වීම ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම වැටුප් දායක මුදල් එකී සේවකයාගේ වැටුපෙන් අවකරණය කිරීම සඳහා සමිතිය කටයුතු කල යුතුය.

04.4 සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයකුගේ මාසික වැටුපෙන් අවකරණය කරන ලද මුදල් ඇතුළු සේවකයාට අදාල මාසික දායකත්වය ඊලඟ මස අවසන් දිනට පෙර සමුපකාර

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ වරයාට ලැබෙන සේ ලංකා බැංකු ගාල්ල ශාඛාවේ **85964274 ගිණුම්** අංකයට බැර කල යුතුය. එම බැර කිරීම් කලයුතු ආකාරය සම්බන්ධව සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ දක්වා ඇත.

04.5 එසේ නිසි පරිදි ප්‍රේෂණය නොකළහොත් ඒ සඳහා දඩ මුදල් අයකිරීමට 2019 සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම නියෝගයන්හි ප්‍රතිපාදන ඇත. එලෙස දඩ මුදල් ගෙවීම නිසා සමුපකාර සමිතියට අමතර වැය බරක් දැරීමට සිදුවන අතර එහි ප්‍රතිලාභයක් සමිතිය වෙත නොලැබේ. එබැවින් සමිතියේ අභ්‍යන්තර පාලන ක්‍රමවේද හා කාර්යාල ක්‍රම ස්ථාපනය තුලින් ප්‍රමාදයකින් තොරව නිසි පරිදි සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක මුදල් යොමු කිරීම හා සම්බන්ධීකරණය සඳහා ඔබ විසින් පියවර ගත යුතුය. එසේ විධිමත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක නොකිරීමෙන් සමුපකාර සමිතියට වන ඍණාත්මක බළපෑම සම්බන්ධව සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව තනි තනිව හා සාමූහිකව වගකීමට බැඳේ.

04.6 යම් සේවකයක් වෙනුවෙන් වන දායකය වෙනස් විය හැක්කේ වැටුප් වර්ධකයක් ලැබීම හෝ තනතුරේ උසස්වීමක් ලැබීම හෝ කලින් කලට වන වැටුප් සංශෝධනයක් වැනි සීමිත අවස්ථා කිහිපයකදී පමණි. එසේ පෙර මස දායක මුදල වෙනස්වන අවස්ථාවක ඒ පිළිබඳ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ලිඛිත සාක්ෂි සමඟ (වැටුප් වර්ධකයක් නම් එහි පිටපතක් සමඟ) දැනුවත් කිරීම කල යුතුය. වැටුප් වර්ධක ඉල්ලීම් නිසි වේලාවට ලබා දීමට සේවකයා දැනුවත් කිරීමත්, නෛතික සීමාවන් තුළ වැටුප් වර්ධක කඩිනමින් ලබා දීමත් ඔබගේ වගකීමක් බව ද අවධාරණය කරමි.

**06. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීම**

සමුපකාර විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය නිසි පරිදි ලබා ගත් සමුපකාර සේවකයන් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුප් අප්‍රමාදීව ගෙවීම සඳහා විශ්‍රාම යාමට පූර්වයෙන් ඔබ විසින් ඉදිරිපත් කල යුතු ලිපි ලේඛණ හා ආකෘති අවම වශයෙන් විශ්‍රාම යෑමට සය මසකට වත් පෙර සම්පූර්ණ කල යුතු බව අවධාරණය කරමි. එබැවින් විශ්‍රාම හිමිකම ලැබීමට අපේක්ෂිත සේවකයා මඟින් සම්පූර්ණ කල යුතු ලේඛණ සකස් කරවා සමිතිය විසින් යොමු කල යුතු ලේඛණ සමඟ ඉදිරිපත් කිරීමට ඔබ විසින් ක්‍රමවේදයක් සකස් කල යුතුය.

විශ්‍රාම වැටුප නිර්ණය කරනු ලබන්නේ සමුපකාර සේවක කොමිෂන් සභාව නිකුත් කරන, අදාල විශ්‍රාම වැටුප අපේක්ෂිත සමුපකාර සේවකයා අනුමත කර ඇති ලිපියේ සඳහන් වැටුප් පරිමාණය හා වැටුප් වර්ධක දිනය පදනම් කරගෙනය. එබැවින් විශ්‍රාම වැටුප වැඩිකරලීමේ අරමුණින් නිසි කාලයට පෙර හෝ විධිවිධානයන්ට පරිබාහිරව වැටුප් වර්ධක ලබා දීම නොකල යුතු අතර ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය / කාරක සභාව ද දැනුවත් කල යුතු ය.

**07. සමුපකාර සමිති සේවකයන් සම්බන්ධ පුද්ගලික ලිපි ගොනු සැකසීම**

07.1 සමුපකාර සමිතියකට බඳවා ගනු ලබන සේවකයන් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද පුද්ගලික ලිපි ගොනුවක් නඩත්තු කල යුතුය. සමුපකාර සේවකයන් සම්බන්ධ පත්වීම් බලධරයා වන අදාල සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය/ කාරක සභාව මෙම පුද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම, ලිපි ගොනු ආරක්ෂාව ඇතුළු ලිපිගොනු නඩත්තුව නිසි පරිදි කාර්යාල ක්‍රම හා අභ්‍යන්තර පාලන ක්‍රමයන්ට අනුගතව සිදු කල යුතුය.

07.2 එකී ලිපිගොනුව තුළ විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාල ලිපි ලේඛණ ද ගොනුගත විය යුතු අතර වාර්ෂික වැටුප් වර්ධක සම්බන්ධ වාර්තාවන්ද ඇතුළත්ව තිබිය යුතුය.

07.3 සෑම සමුපකාර සේවකයෙකුටම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ නඩත්තු වන සිය පුද්ගලික ලිපි ගොනුව වර්ෂයකට එක් වතාවක් නිරීක්ෂණය කිරීමටත්, එහිදී අනාවරණය වන අඩුපාඩු වේ නම් ඒවා සම්පූර්ණ කර ගැනීමටත් අවස්ථාව ඇත. එබැවින් එකී ලිපි ගොනුව නිරීක්ෂණය කර නිසි පරිදි යාවත්කාලීන කර ගැනීමට සිය සමිති සේවකයන් වෙත උපදෙස් ලබා දෙන ලෙසත්, ඒ සඳහා

අවස්ථාව ලබා දෙන ලෙසත් මෙයින් උපදෙස් ලබා දෙමි. එමඟින් සේවකයා වෙත විශ්‍රාම වැටුප් හිමිකම අප්‍රමාදීව ලබා දීමට හැකිවන බැවින් ඔබගේ ප්‍රමුඛ අවධානය ඒ සඳහා යොමු කල යුතුය.

**08. 2019.04.01 දිනට පෙර දකුණු පළාතේ සමුපකාර සමිතිවල ස්ථිර සමුපකාර සේවකයන් සම්බන්ධ ව කටයුතු කිරීම**

08.1 මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුව සිටි, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට කැමති මේ වන විටත් දායකත්වය ලබා නොගත් සේවකයන් සඳහා 2460/10 අංක දරණ 2025.10.28 දිනැති ගැසට් නිවේදනය මඟින් 2025.12.31 දක්වා අවස්ථාව ලබා දී ඇත.

08.2 එබැවින් ඔබ සමිතියේ එකී හිමිකම ලබන සේවකයන් සිටීනම් හා ඔවුන් මෙම දායක ක්‍රමයට බැඳීමට කැමැත්තේ නම් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීම සඳහා අවස්ථාව ලබා දීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

09. මෙම චක්‍ර ලේඛයේ විධිවිධාන 2026.01.01 සිට බලාත්මක කෙරේ. මෙම චක්‍රලේඛය දකුණු පළාත් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට සමාන්තරව නිකුත් කරන අතර දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ද චක්‍ර ලේඛයක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

සී.වික්‍රමසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත, ගාල්ල

සී. වික්‍රමසිංහ
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප.)
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත් -
01. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - කා.දැ.පි
02. ස.සං.සහකාර කොමසාරිස් (ගාල්ල/මාතර/හම්බන්තොට)
03.සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන්
(02, 03) - සම්මුඛ පරීක්ෂණ අවස්ථා, ප්‍රගති සමාලෝචන රැස්වීම් අවස්ථා, සංවර්ධන හා විගණන කටයුතු සිදුවන අවස්ථාවලදී දැනුවත් කිරීම හා අධීක්ෂණය සඳහා